**පීපල්ස් ට්‍රැවල්ස් ලිමිටඩ් - 2022/ 2023**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

පීපල්ස් ට්‍රැවල්ස් ප්‍රයිවට් ලිමිටඩ් ("සමාගම ") හි 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහාය මා ලබා ගන්නා ලදී.

සමාගමේ 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී , සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර , කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම් ,වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් , ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර , මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ .

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී . තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට , ප්‍රමාණවත් හා සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර , දුස්සන්ධානය ,ව්‍යාජ ලේඛන සැකසීම ,චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුවේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමාගමේ අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත් වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව ;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියාකර තිබේද යන බව ;

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව සමාගම කටයුතු කර ඇතිබව ;

- සමාගමේ සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව ;

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ලැබිය යුතු මුදල් රු.20,075,063 ක් හෝ සමස්ත වෙළඳ ණයගැතියන්ගෙන් සියයට 85 ක් රජයේ ආයතනවලින් නියෝජනය කරන අතර රු.604,615 ක් හෝ මුළු ලැබිය යුතු මුදලින් සියයට 3 ක් මහජන බැංකුව වෙතින් ලැබිය යුතු වේ. කෙසේ වුවත් සමාගමේ ණය ප්‍රතිපත්තියට අනුව ණය අය කරගත යුතු කාලය දින 15 ක් වුවද , රු. 7,734,186 වූ වෙළඳ ණයගැති ශේෂය තුල වසර 01 කට වැඩි කාලයක සිට හිඟව පවතින ශේෂ ඇතුලත් වන අතර සමාගම විසින් එම හිඟ ශේෂ වසර තුල අයකර ගැනීමට අපොහොසත්ව තිබුණි. | සටහන් කර ගන්නා ලදී. ආර්ථික අර්බුදය හමුවේ සමහර ආයතනික ණයගැතියන් තවමත් ගෙවීම් කර නොමැත. තත්වය සාමාන්‍ය වූ පසුව ඒවා නිරවුල් කර ගන්නා අතර ගෙවීම් සඳහා ලිඛිත මතක් කිරීම් වෙනුවෙන් පිළිතුරු ලැබෙන්නේ අඩුවෙනි. එබැවින් අදාළ බලධාරීන් හමුවී ගෙවීම් පිළිබඳ පසු විපරම් කරන්නෙමු. | ණය ශේෂයන් ආපසු අයකර ගැනීමේ හැකියාව සහතික කිරීම සඳහා පසු විපරම් ක්‍රියා පරිපාටි ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 1.5.2 ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාගම් ප්‍රතිපත්තියට අනුව, ආපසු ගෙවිය යුතු ආදායම් වසර 2ක කාලසීමාවක් තුළ එකතු නොකලේ නම් සහ පාරිභෝගිකයා විසින් විද්‍යුත් තැපැල් මාර්ගයෙන් මුදල් ආපසු ලබා ගැනීමට පුද්ගලයකු නම් කර නොමැති නම් හෝ පාරිභෝගික පාර්ශවයෙන් නම් කරන ලද පුද්ගලයා සම්බන්ධ කරගත නොහැකි නම්, එය ලාභයක් ලෙස සලකා ලාභ හා අලාභය වෙත මාරු කිරීම කළ යුතුය. කෙසේ වෙතත්, වසර දෙකක කාලයකට පෙර වූ ගනුදෙනු සම්බන්ධයෙන් රු.1,175,645 ක් පීපල්ස් ට්‍රැවල්ස් ප්‍රයිවට් ලිමිටඩ් හි ආපසු ගෙවිය යුතු මුදල් ලෙස නිරවුල් කිරීමකින් තොරව රැඳී තිබුණි. | සටහන් කර ගන්නා ලද අතර සඳහන් කර ඇති ආපසු ගෙවීම් ලාභයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | සමාගම් ප්‍රතිපත්තියට අනුකූල වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.6 විගණනය සඳහා ලේඛනගත සාක්ෂි ඉදිරිපත් නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොඩනැගිල්ල සඳහා නිසි බදු ගිවිසුමක් 2020 වසරේ සිට මහජන බැංකුව සහ පීපල්ස් ට්‍රැවල්ස් සමාගම අතර නොතිබුණි | සටහන් කර ගන්නා ලද අතර මහජන බැංකුව සමඟ ඇති බදු ගිවිසුම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | එම ලේඛන ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු ය. |

## 1.7 බදු රෙගුලාසි වලට අනුගත නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු එකතු කල අගය මත බදු ශේෂය රු. 453,695 ක් වන අතර එය මූල්‍ය වර්ෂය 2019/20 සිට පවතී. | සටහන් කරගන්නා ලද අතර සැලකිල්ලට ගෙන දැඩිව අනුගත වීමට කටයුතු කෙරේ . | අනාගත දණ්ඩන ප්‍රතිපාදන වළක්වා ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ අවශ්‍ය විධිවිධාන සලසා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය බදු පෙර ලාභය රු. 19,096,384 ක් වූ අතර ඉකුත් වර්ෂයේ අනුරූප අලාභය රු. 6,500,086 කි. ඒඅනුව , මූල්‍ය ප්‍රතිඵලයේ රු. 25,596,470 ක වර්ධනයක් නිරීක්ෂණය විය. විකුණුම් පිරිවැය රු. 31,912,460 කින් ඉහල ගොස් තිබියදීත් ආදායම රු. 61,908,619 කින් ඉහලයාම මෙම වර්ධනයට හේතු විය.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමයන්හි ප්‍රවණතා විශ්ලේෂණය

2.2.1 සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතරක සමාගමේ මූල්‍ය ප්‍රතිඵලවල සාරාංශයක් පහත වගුවේ දැක්වේ.

| වර්ෂය | **2022/2023** | **2021/2022** | **2020/2021** | **2019/2020** | **2018/2019** |
|---|---|---|---|---|---|
| ආදායම (රු .) | 75,857,351 | 13,948,732 | 1,246,459 | 120,088,342 | 257,589,156 |
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩිවීම/(අඩුවීම) % | 443.83 | 1,019.07 | (98.96) | (53.38) | |
| සේවා පිරිවැය (රු.) | 31,912,460 | - | - | 88,514,075 | 204,164,717 |
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩිවීම/(අඩුවීම) % | 100.00 | 0 | (100.00) | (56.65) | |
| බදු පෙර ලාභය (රු.) | 19,096,384 | (6,500,086) | (19,236,130) | (9,152,378) | 11,976,442 |
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩිවීම/(අඩුවීම) % | 393.79 | 66.21 | (110.18) | (176.42) | |

2.2.2 සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල විශ්ලේෂණයක් පසුගිය වර්ෂය සමඟ සසඳා , වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතයන් සහිතව පහත වගුවේ දැක්වේ.

| **විස්තරය** | **විචලනයේ වටිනාකම** වැඩිවීම/(අඩුවීම) (රු .) | **විචලනයේ %** | **විචලනයට හේතු** |
|---|---|---|---|
| ආදායම | 61,908,619 | 443.83% | COVID 19 වසංගතයෙන් පසු මේ වන විට ජාත්‍යන්තර, දේශීය සහ කලාපීය සංචාරයන් දැනටමත් නැවත ආරම්භ වීමත් , ගුවන් ටිකට්පත් අලෙවිය හා විවේකය සඳහා බැහැරට යන සංචාරකයන්ගේ අලෙවිය වැඩිවීම |
| විකුණුම් පිරිවැය | 31,912,460 | 100.00% | 2022-23 මල්‍ය වර්ෂය තුල දඹදිව චාරිකා 04 ක් ක්‍රියාත්මක වීම. |
| පරිපාලන වියදම | 8,619,100 | 37.88% | කාර්යාලය 2022 සිට නැවත විවෘත වීම හා පරිපාලන හා මෙහෙයුම් වියදම් වැඩිවීම. |
| මූල්‍ය ආදායම | 5,146,578 | 162.56% | ස්ථාවර තැන්පතු පොලි අනුපාත වැඩිවීම හා කෙටි කාලීන ආයෝජන සැලසුම් ඉහල යාම |

## 2.3 අනුපාත විශ්ලේෂණය

ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ සමාගමේ වැදගත් අනුපාත පහත වගුවේ දැක්වේ.

| **විස්තරය** | **2022/23** | **2021/22** |
|---|---|---|
| මෙහෙයුම් ලාභ ආන්තිකය | 15.44% | (64.36%) |
| ශුද්ධ ලාභ අනුපාතය | 25.17% | (46.60%) |
| හිමිකම මත ප්‍රතිලාභය (ROE) | 24.94% | (10.58%) |
| වත්කම් මත ප්‍රතිලාභය (ROA) | 14.33% | (6.77%) |
| ජංගම අනුපාතය | 1.83 | 1.57 |
| ණය අනුපාතය | 0.43 | 0.36 |
| ණය හිමිකමට අනුපාතය | 0.74 | 0.56 |